**2022.08.25**

**පසුබිම් සටහන**

## 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධන කිරීම සඳහා වූ විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත

ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යවරයා ලෙස 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධන කිරීම සඳහා වූ විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ සමාරම්භක කථාව අගෝස්තු 30 වැනිදා සිදු කිරීමට නියමිතය. ඉන් අනතුරුව විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ විවාදය ලබන අගෝස්තු 31 සැප්තැම්බර් 01 සහ 02 යන දිනවල පැවැත්වේ.

මේ අනුව මෙම පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය සකස්කළ පසුබිම් සටහනක් ඇසුරෙන් මෙය ඉදිරිපත් කෙරේ.

2022 මුදල් වර්ෂය සඳහා අවශ්‍ය සේවා වියදම් සහ විධිවිධාන සැලසීමේ අරමුණින් එවකට මුදල් අමාත්‍යවරයාව සිටි බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත විවාදයට ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නා ලදී. එ් අනුව විසර්ජන පනත් කෙටුම්පත, පනතක් වශයෙන් 2021 දෙසැම්බර් 10 වැනි දින සහතික කරන ලද අතර එය 2021 අංක 30 දරන විසර්ජන පනත බවට පත් විය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිධුරයට පත්වූ පසු 2022.07.28 වැනි දින පාර්ලිමේන්තුව වාර අවසාන කරන ලද අතර 2022 අගෝස්තු 3 වැනි දින නව වැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ආරම්භ කරන ලදි. ඒ අනුව, අභිනව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා තම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරමින් නව අයවැයක් ඉදිරිපත් කරන බව එහිදී ප්‍රකාශ කළේය.

එහි ප්‍රතිඵලයක් ලෙස නව රජයක් වශයෙන් 2022 මුදල් වර්ෂයේ ඉතිරි කාලය සඳහා මෙම විසර්ජන පනත් කෙටුම්පත, පෙර ඉදිරිපත් කරන ලද විසර්ජන පනතට සංශෝධනයක් වශයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වේ. 2021 අංක 30 දරන විසර්ජන පනත් සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවේ පළමු වන වර කියවීම වශයෙන් 2022 අගෝස්තු 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමට මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා කටයුතු කළේය.

එම පනත් කෙටුම්පතට අනුව, 2021 අංක 30 දරන විසර්ජන පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වූ,

> **රුපියල් දෙදහස් හත්සිය අනූ හය බිලියන හාරසිය හතලිස් හය මිලියන පන්සිය පනස්අට දහසක් (රු. 2,796, 446,558,000)** යන වචන වෙනුවට රුපියල් තුන් දහස් දෙසිය හැත්තෑ පස් බිලියන අටසිය හැත්තෑ හය මිලියන පන්සිය පනස් අට දහසක් (රු. 3,275,876,558,000) යන වචන ආදේශ කෙරේ.

**සංශෝධනයේ බලපෑම**

පෙර ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පතට අනුව, 2022 මුදල් වර්ෂය සඳහා ආණ්ඩුවේ අමාත්‍යාංශ සේවා විදයදම් දැරීමට 2022 ජනවාරි මස 1 වැනි දින සිට 2022 දෙසැම්බර් 31 වැනි දක්වා රු බිලියන 2,796.4 ක මුදලක් ඇස්තමේන්තුගත කොට තිබිණ. නව සංශෝධනයට අනුව 2022 වර්ෂයේ ආණ්ඩුවේ අමාත්‍යාංශ සේවා වියදම් දැරීමට වෙන් කළ මුදල රු. බිලියන 3,275.8 දක්වා ඇස්තමේන්තු ගත මුදල වැඩි වන අතර ඒ අනුව රු බිලියන 929.4 කින් අමාත්‍යාංශ සේවා කාර්යය සඳහා අවශ්‍ය වන වියදම් වැඩිවී ඇත.

> **පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අඩංගු රුපියල් බිලියන තුන්දහස් දෙසියයක් (රු. බිලියන 3,200) වන වචන වෙනුවට රුපියල් බිලියන හාර දහස් අසූ දෙකක් (රු. බිලියන 4,082) යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ.**

**සංශෝධනයේ බලපෑම**

2022 මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් බැහැරින් ලබාගන්නා ණය මුදල එම වර්ෂය තුළ රු. බිලියන 3,200 සිට රු. බිලියන 4,082 ක මුදලක් දක්වා වැඩි කරනු ලැබේ. ඒ අනුව පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව රජයේ ණය ගැනීමේ සීමාව රු. බිලියන 892 කින් පමණ වැඩි කොට ඇත.

> **2021 අංක 30 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ 4 වන උපවගන්තියේ සඳහන් රුපියල් දෙදහස් හයසිය විසි තුන් බිලියන එකසිය විසි තුන් මිලියන හාරසිය හතලිස් දෙදහසක් (රු. බිලියන 2,623) යන වචන වෙනුවට රුපියල් දෙදහස් නවසිය එක් බිලියන එකසිය විසිතුන් මිලියන හාරසිය හතලිස් දෙදහසක් (රු. මිලියන 2,901) යන වචන ආදේශ කෙරේ.**

**සංශෝධනයේ බලපෑම**

මෙම 4 වන උප වගන්තිය සංශෝධනයත් සමග, 2022 මුදල් වර්ෂය තුළ සේවා වියදම් සඳහා නීති මගින් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බවට බලය ලබාදෙන රජයේ ඇස්තමේන්තුගත වියදම හෙවත් ණය සේවා කරණ වියදම රු. බිලියන 2,623 සිට රු. බිලියන 2,901 දක්වා වැඩි කිරීමට අවස්ථාව ලබාදී ඇත.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට අනතුරුව 9 අ වශයෙන් නව වගන්තියක් 2021 අංක 30 දරන විසර්ජන පනතට නව සංශෝධනය මගින් ඇතුලත් කෙරේ.

එනම්,

> **2022 ජනවාරි මස 1 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 දක්වා වූ කාලසීමාව තුළ වියදම් සඳහා මුදල් ප්‍රතිපාදන සලස්වමින් පාර්ලිමේන්තුව විසින් 2022 වසර තුළ මේ දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ සම්මත කරනු ලැබූ යෝජනා වල කුමක් සඳහන් වුවත්, අදාල යෝජනා සම්මතවල නිශ්චිතව දක්වා ඇති යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනකට වෙන් කරන ලද මුදල්වලින් අදාළ කාලසීමාව තුළ දී වියදම් කරන ලද එකී සියලු මුදල්**

**ප්‍රමාණය මෙම නව පනත ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී වියදම් කර නොමැති යම් මුදලක් වේ ද මෙම පනතේ උපලේඛණවල නිශ්චිත දක්වා ඇති ශීර්ෂ යටතේ වූ වියදම් දැරීමට එම මුදල් ද වෙන් කරන ලද මුදල් ලෙස සැලකිය යුතුය.**

**සංශෝධනයේ බලපෑම**

එනම් 2022 මුදල් වර්ෂ සඳහා කලින් අනුමත කරන ලද 2021 අංක 30 දරන විසර්ජන පනතේ යටතේ වූ මුදල් ඒ ඒ අමාත්‍යාංශයන් හි නිශ්චිත ශීර්ෂ යටතේ දක්වා ඇති වැඩසටහන්වලට වෙන් කරන ලද මුදල් වියදම් කර අවසන් කොට නොමැති හෙයින් එම මුදල් ද මෙම සංශෝධනය යටතේ තවදුරටත් වියදම් කිරීමට බලය ලබා දේ. ඒ අනුව යමින්, 2021 අංක 30 දරන විසර්ජන පනත යටතේ ඉදිරිපත් කරන ලද 2022 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදල විශේෂ වියදම් ඒකක (ජනාධිපති ඇතුළු කොමිෂන් සභා කාර්යාල සඳහා වූ වියදම්) සහ අමාත්‍යාංශ සඳහා වෙන් කරන ලද මුදල් ද සංශෝධනය වේ.


**2022 මුදල් වර්ෂයේ අමාත්‍යාංශ සඳහා මුදල් වෙන් කිරීම**


2021 අංක 30 දරන අනුමත විසර්ජන පනත සහ ඊට ඉදිරිපත් කරන විසර්ජන සංශෝධන පනතට අනුව අමාත්‍යාංශ බෙදා වෙන් කිරීම් වෙනස් වේ. විශේෂයෙන් 2022 මුදල් වර්ෂයට අදාලව 2021 ඔක්තෝබර් මස 07 වැනි දින මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද විසර්ජන පනතෙ හි විශේෂ වියදම් ඒකක වලට අමතරව අමාත්‍යාංශ 32 ක් සහ රාජ්‍ය අමාත්‍යාංශ 43 ක් වශයෙන් පැවතිණ. ඒ අනුව සමස්ත අමාත්‍යාංශ සේවා වියදම් සැපයීම වෙනුවෙන් 2021 ඔක්තෝම්බර් මස 07 වැනි දින විසර්ජන පනත් කෙටුම්පතේ රු. බිලියන 2,505 ක් වෙන් කොට තිබිණ.

එම විසර්ජන පනත් කෙටුම්පත විවාදයට ගැනීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් මස 10 වැනි දින 2021 අංක 30 දරන විසර්ජන පනත වශයෙන් සහතික කෙරිණ. එම පනතට අනුව අමාත්‍යාංශ සඳහා වෙන් කරන ලද මුදල රු. බිලියන 2,796 ක් වශයෙන් වෙනස් වේ.


2022 මුදල් වර්ෂයේ ඉදිරි මාස සඳහා ඉදිරිපත් කෙරෙන විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පතට අනුව අමාත්‍යාංශ සේවා වියදම් දැරීම වෙනුවෙන් රු බිලියන 3,276 ක් වෙන් කොට ඇත. මෙම මුදල වෙන් වන්නේ අමාත්‍යාංශ 29 ක් සඳහා වීම (විශේෂ වියදම් ඒකක හැරුණු කොට) විශේෂත්වයයි. කෙසේ වෙතත් මීට පෙර අමාත්‍යාංශ සඳහා වෙන් කරන ලද මුදල් සහ වියදම් නොදරන ලද මුදල් ද යන සියල්ලෙහිම එකතුවක් ලෙස මෙය දැක්වේ. එහෙයින් පැවති විසර්ජන පනතට අනුව නව විසර්ජන පනතින් සේවා වියදම වෙනස් වන්නේ රු. බිලියන 480 කිනි.

**2021.10.07 වැනි දින සහ 2022.08.09 වැනි දින ඉදිරිපත් කරන ලද විසර්ජන පනතට අනුව ඉහළම මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලද අමාත්‍යාංශ**







සමස්ත අමාත්‍යාංශ වියදම් වෙන් කිරීම් වලින් සියයට 73 ක් අමාත්‍යාංශ 6ක් අතරේ වෙන් වන අතර ඉතිරි අමාත්‍යාංශ 23 සඳහාම වෙන්වන්නේ සියයට 27 කි.



**<u>2022 මුදල් වර්ෂයේ ශීර්ෂ අංක 1-25 දක්වා විශේෂ වියදම් ඒකක සඳහා විසර්ජන පනත් කෙටුම්පත මගින් වෙන් කරන ලද මුදල්</u>**

මෙම විශේෂ වියදම් ඒකක වෙනුවෙන් 2022 මුදල් වර්ෂය සඳහා 2021 ඔක්තෝබර් 07 වැනි දින ඉදිරිපත් කරන ලද විසර්ජන පනත සහ 2022 විසර්ජන පනතට 2022 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් වන සංශෝධනය මගින් වෙන් කරන ලද මුදල් හි සංසන්දනයක් ඇතුලත් කොට ඇත




සැකසුම - පර්යේෂණ අංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.